# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය, දෙවන වසර (මාර්ගගත) - 2021

## සාධාරණත්වය සහ භාර නීතිය

(පැ තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව: 06

ඕනෑම ප්‍රශ්න තුනකට **පමණක්** පිළිතුරු සපයන්න.

(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

1. වර්තමානයේ දී පවා විනිශ්චයකාරවරු සිය නඩු තීන්දු තුළ විවිධ සාධාරණත්වයේ ආප්ත උපුටා දක්වති. එසේ වුවද, ප්‍රති-තර්ක කියා සිටින්නේ, ඒවායේ සැබෑ අරුත නොසලකා ඒවා සරලව 'මන්ත්‍රයක්' ලෙස භාවිතා කරන බැවින් මෙම ආප්ත නොසලකා හැරිය යුතු බවයි. ප්‍රධාන තර්ක දෙකක් නම්, විනිශ්චයකාරවරුන්ට ආප්තයක් ආදේශ කිරීමෙන් ඔවුන්ගේ විනිවිද පෙනෙන හේතු දැක්වීම් සැඟවිය හැකි බව, සහ ඇතැම් අවස්ථාවලදී විනිශ්චයකාරවරුන්ට විවිධ ආප්ත අතර වෙනස අමතක වන බවත්ය.

   ඔබ එකඟ වන්නෙහිද? අදාළ අධිකාරීන් ඇසුරින් ඔබගේ පිළිතුරට හේතු සහ යුක්තිසාධනය ලබා දෙන්න.

   (ලකුණු 100)

2. නිශාල් ලොතරැයියක පළමු ත්‍යාගය දිනා ගත් අතර පුණ්‍ය භාර නිර්මාණය කිරීමට අපේක්ෂා කරයි. ඉංග්‍රීසි නීතිය සමඟ සංසන්දනය කරමින්, පහත අවස්ථාවලදී වලංගු පුණ්‍ය භාරයක් නිර්මාණය වන්නේ දැයි සලකා බලන්න.

   (අ) මෝඩිෂාවාදය නම් ආගමක, අන්තගාමී අදහස් ප්‍රවර්ධනය කිරීම සඳහා මෝඩිෂා නම් ආගමික පාසල සඳහා රුපියල් මිලියනයක පරිත්‍යාගයක්.

   (ආ) සෑම වසරකම මගේ උපන්දිනයේදී මගේ ගමේ දුප්පත් ජනතාවට දිවා ආහාරය ලබා දීමට රුපියල් මිලියනයක්.

   (ඇ) ගමේ තරුණයින්ට කරාටේ පන්ති පැවැත්වීම සඳහා මගේ ගමේ ක්‍රීඩා සමාජයට රුපියල් 50,000 ක්.

(ඇ) මහරගම අපේක්ෂා රෝහල අසල ඇති මගේ ඉඩම, රෝහලට පැමිණෙන අමුත්තන්ගේ ප්‍රයෝජනය සඳහා වාහන නැවැත්වීමේ පහසුකම් නොමිලේ ලබා දීමට.

(25X4 =ලකුණු 100)

3. (අ) සහ (ආ) කොටස් දෙකටම පිළිතුරු සපයන්න.

(අ) 'වැළැක්වීමේ ඉන්ජන්ෂන් නියෝග (prohibitory injunction) මඟින් විත්තිකරුට යම් දෙයක් කිරීමෙන් වළකින ලෙස නියෝග කරන අතර එය ධනාත්මක ඉන්ජන්ෂන් නියෝගවලට (mandatory injunction) වඩා පහසුවෙන් ලබා දෙනු ඇත.'

ඉහත ප්‍රකාශයේ වලංගුභාවය සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර අදාළ නඩු තීන්දු මගින් සනාථ කළ යුතුය.

(ආ) නිකොලයින්, නැගී එන නිරූපිකාවක වන අතර 2020 දී පැවැත්වූ රූ රැජිණ තරඟයකදී අනුශූරතාවයට පත් වූවාය. ඇය ස්ටාර් චැනල් නම් ජනප්‍රිය රූපවාහිනී නාලිකාවක් සමඟ ගිවිසුමකට එළඹුණේ 2021 වසරේදී එහි නවතම ටෙලි නාට්‍ය වන "ද මාස්ක්" හි ප්‍රධාන චරිතය නිරූපණය කිරීම සඳහාය. ස්ටාර් නාලිකාවේ ලිඛිත අවසරයකින් තොරව වසර දෙකක් වෙනත් කිසිදු නාලිකාවක් සඳහා රඟපෑම සිදු නොකරන බවට ඇය එකඟ වූවාය. ගිවිසුමෙන් මාස හයකට පසු, ඔවුන්ගේ නවතම ටෙලි නාට්‍යයේ ප්‍රධාන නිළිය වීමට ට්වින්කල් නාලිකාවෙන් ඇයට අර්පණයක් ලැබුණි. ඇය එම ඉල්ලීම පිළිගත් අතර ට්වින්කල් නාලිකාවෙන් මිලියනයක අත්තිකාරම් ගෙවීමක්ද ලබා ගත්තාය.

නිකොලයින් විසින් ගිවිසුම උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් නීතිමය පියවරක් ගත හැකිද යන්න පිළිබඳව ස්ටාර් නාලිකාව ඔබගේ උපදෙස් අපේක්ෂා කරයි. ඔවුන්ට උපදෙස් දෙන්න.

(50X2 =ලකුණු 100)

4. සුප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙකු වන රාගවන්ට නීලා සහ මාලා නම් දියණියන් දෙදෙනෙකු සහ රජීව් නම් පුතෙකු සිටියි. පහත සඳහන් අරමුණු සඳහා රාගවන් තම දේපළ ඔහුගේ මිතුරා වන රාජන්ට පවරා දී ඇත:

(අ) ඔහුගේ මෝටර් රථ ව්‍යාපාරය කරගෙන යාමට සහ එම ව්‍යාපාරයෙන් ලැබෙන ලාභ, රාජන්ගේ කැමැත්ත පරිදි, නීලාගේ හෝ මාලාගේ උසස් අධ්‍යාපනය සඳහා යොදා ගැනීමට;

(ආ) නීත්‍යානුකූලව අනුමැතිය ලබා දී නැති ඔහුගේ තුවක්කු ව්‍යාපාරයෙන් ලද ලාභයෙන් ඔහුගේ පුත් රජීව්ගේ අවශ්‍යතා ගැන සොයා බැලීමට;

(ඇ) වත්ත ලාභ ලබන්නේ නම්, ඔහුගේ තේ වත්තේ ලාභ සමානව දියණියන් දෙදෙනා අතර බෙදා දීමට;

(ඇ) පුත්තලමේ පිහිටි ඔහුගේ පොල් වත්ත නඩත්තු කිරීමට සහ ලාභය රාගවන්ගේ ඥාති සහෝදරයන්ගේ දරුවන්ගේ ප්‍රයෝජනය සඳහා යෙදවීමට;

(ඉ) මහනුවර ව්‍යාපාර සංකීර්ණය විකිණීමට සහ විකිණීමෙන් ලැබෙන ආදායමෙන් ණය හිමියන්ට ණය ගෙවීමට.

ඉහත ඉල්ලීම් මඟින් වලංගු භාරයක් නිර්මාණය වන්නේද යන්න පිළිබඳව භාර ආඥා පනතේ අදාළ ප්‍රතිපාදන සහ විනිශ්චිත නඩු තීන්දු උපුටා දක්වමින් සාකච්ඡා කරන්න.

(20X5 =ලකුණු 100)

5. නිමලන්ට වෙළඳසැලක් සහ අක්කර පහක පොල් වත්තක් තිබුණි. නිමලන්, ඇයගේ විවාහයේදී දෑවැද්ද ලෙස දීම සඳහා ඔහුගේ බාල සොහොයුරිය වන රාණිගේ නමින් නිවසක් මිලදී ගත්තේය. නිමලන්ගේ කැමැත්තට එරෙහිව රාණි පිරිමි ළමයෙකු සමඟ විවාහ වූවාය. ඕස්ට්‍රේලියාවේ පුරවැසියෙකු වූ දිව්‍යා සමඟ විවාහ වීම හේතුවෙන්, නිමලන්ට ඕස්ට්‍රේලියාවේ සංචාරය කිරීමට සිදු විය. දිව්‍යා, නිමලන්ට වසර කිහිපයකට ඕස්ට්‍රේලියාවේ රැඳී සිටින ලෙස බල කළ අතර දෙදෙනාටම නැවත ලංකාවට පැමිණ ස්ථිරවම ලංකාවේ වාසය කළ හැකි බවට යෝජනා කළාය. ඕස්ට්‍රේලියාවට යාමට පෙර නිමලන්, වෙළඳසැල ඔහුගේ සේවකයෙකු වන කුමාරන් වෙත පැවරූ අතර ඔහු ඕස්ට්‍රේලියාවේ සිට නැවත පැමිණෙන තුරු ව්‍යාපාර කටයුතු බලාගන්නා ලෙස ඔහුගෙන් ඉල්ලා සිටියේය. නිමලන් තම මිතුරා වූ සුරේෂ්ට පවසා සිටියේ වසර කිහිපයක් ඔස්ට්‍රේලියාවේ ගත කිරීමට අදහස් කරන බවත් ඔහුගේ පොල් වත්ත සුරේෂ්ට පැවරූ බවත්ය. වතුයායේ ආදායම නිමලන්ගේ දෙමාපියන්ගේ බැංකු ගිණුමේ තැන්පත් කරන ලෙස නිමලන්, සුරේෂ්ගෙන් ඉල්ලා සිටියේය. කෙසේ වෙතත්, සුරේෂ් එම ආදායම ඔහුගේම බැංකු ගිණුමක තැන්පත් කළේය. නිමලන් ඕස්ට්‍රේලියාවේ සිට වාසුට මුදල් එවූ අතර නිමලන්ගේ වැඩිමහල් සහෝදරිය වන මලර්ගේ නමට බම්බලපිටියේ මහල් නිවාසයක් පවරන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටියේය. මුහුද සමඟ සුන්දර දර්ශනයක් ඇති හෙයින් එම මහල් නිවාසය මිලදී ගැනීමට අවශ්‍ය වූ බවත්, ඕස්ට්‍රේලියාවේ සිට පැමිණි පසු ඔහුට එම මහල් නිවාසයේ වාසය කර සොබාදහම රස විඳිය හැකි බවත් ඔහු මලර්ට පැවසීය.

නිමලන් ඕස්ට්‍රේලියාවේ සිට පැමිණි පසු වෙළඳසැල නැවත ලබා දෙන ලෙස කුමාරන්ගෙන්ද වත්තේ ආදායම ආපසු ලබා දෙන ලෙස සුරේෂ්ගෙන්ද ඉල්ලා සිටියේය. එසේම ඔහු රාණිගෙන් නිවස ආපසු ලබා දෙන ලෙසත්, මලර්ගෙන් මහල් නිවාසය නැවත ලබා දෙන ලෙසත් ඉල්ලා සිටියේය. නමුත්, නිමලන් විසින් සිදු කළ ඉල්ලීම, ඔවුන් සියල්ලන්ම ප්‍රතික්ෂේප කර ඇත. දේපළ හා මුදල් සම්බන්ධයෙන් තමන්ට වාසිදායක ලෙස අනුමිත භාරයන් නිර්මාණය වී ඇත්දැයි නිමලන් දැන ගැනීමට අපේක්ෂා කරයි.

භාර ආඥාපනතේ ප්‍රතිපාදන සහ විනිශ්චිත නඩු තීරණ ආශ්‍රයෙන් ඔහුට උපදෙස් දෙන්න.

(ලකුණු 100)

6. (අ) සහ (ආ) කොටස් දෙකටම පිළිතුරු සපයන්න.

(අ) තම දියණියන් වන කුසුම්, මල්ලිකා සහ සෙනුරිගේ ප්‍රතිලාභය උදෙසා, විමල් තම බදුල්ලේ පිහිටි තේ වත්තේ සහ හෝටලයක සම භාරකාරවරුන් ලෙස සිල්වා සහ අමල් පත් කළේය. ලියාපදිංචි නොකළ ලියවිල්ලකින් භාර දේපළ තමන්ට පැවරූ බව සිල්වා සහ අමල් දැන සිටියහ. නමුත් අද දක්වා එම ලේඛනය ලියාපදිංචි කිරීමට ඔවුන් අසමත් වී ඇත. භාර ලේඛනය අනුව, සිල්වා සහ අමල් වතුයායේ සහ හෝටලයේ ලාභ කුසුම්, මල්ලිකා සහ සෙනුරි යන තිදෙනාටම ඔවුන්ගේ වියදම් සඳහා සමානව මාසිකව ගෙවිය යුතුය. අමල්, සෙනුරි සමඟ සබඳතාවක් පැවති අතර ලාභයෙන් 60%ක් සෙනුරිට ගෙවන ලෙස සිල්වාට යෝජනා කළේය. අමල් කළ ඉල්ලීමට සිල්වා එකඟ වූ අතර ඔවුහු ලාභයෙන් 60% ක් සෙනුරිට ගෙවූහ. කුසුම්, මල්ලිකා සහ සෙනුරි හට ගිවිසුම්ක ශක්නුතාවය ඇත. දේපළවල පිරිවැය සහ ලාභ සම්බන්ධ ගිණුම් විස්තර ඉදිරිපත් කරන ලෙස කුසුම් සහ මල්ලිකා භාරකරුවන්ගෙන් ඉල්ලා සිටියහ. ගිණුම් විස්තර ඉදිරිපත් නොකරන ලෙස සෙනුරි යෝජනා කළ අතර කුසුම් සහ මල්ලිකා කළ ඉල්ලීම භාරකරුවන් ප්‍රතික්ෂේප කර ඇත. කුසුම්, මල්ලිකා සහ සෙනුරි නමින් දේපළ පවරන ලෙස කුසුම් සහ මල්ලිකා භාරකරුවන්ගෙන් ඉල්ලා සිටියහ. නමුත් සෙනුරි පැවරීමට විරුද්ධ වූ බැවින් භාරකරුවන් ඔවුන්ගේ නම්වලින් දේපළ පැවරීම ප්‍රතික්ෂේප කර ඇත.

ඉහත සිද්ධිය තුළ ඇති ගැටලු ආශ්‍රිතව පාර්ශවයන්ගේ අයිතිවාසිකම්, යුතුකම් සහ වගකීම් සාකච්ඡා කරන්න. භාර ආඥා පනතේ අදාළ ප්‍රතිපාදන උපුටා දක්වමින් ඔබගේ පිළිතුර තහවුරු කරන්න.

(ආ) හැරී තම දරුවන් වන මිනෝ සහ ජීවාගේ ප්‍රතිලාභයට නිර්මාණය කරන ලද භාරයක් සඳහා රවී සහ ඩේවිඩ් භාරකරුවන් ලෙස පත් කළේය. භාර දේපළ වූයේ ඔහුගේ රබර් වත්තයි. භාර ලේඛනය අනුව, භාරකරුවන්ට මාස හයක් ඇතුළත දේපළ විකිණීමට සහ එයින් ලැබෙන ප්‍රතිලාභ, ප්‍රතිලාභීන්ගේ ප්‍රයෝජනය සඳහා කොටස් වෙළඳපොලේ ආයෝජනය කිරීමට අවශ්‍ය විය. කෙසේ වෙතත්, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් නියමිත කාලය තුළදී විකිණීම සිදු කළ නොහැකි විය. වසංගතය හේතුවෙන් භාර දේපළේ වටිනාකම පහත වැටුණි. වසරකට පසු එම දේපළ අඩු වටිනාකමකට විකුණා ඇත. වෙන්දේසි විකිණීමකදී දේපළ විකිණීමට භාරකරුවන්ගෙන් ඉල්ලා තිබුණි. නමුත් ඔවුන් එම දේපළ ඔවුන්ගේ සමීපතම මිතුරා වූ අජිත්ට පෞද්ගලික විකිණීමකින් විකුණා ඇත. විකිණීමෙන් ලද ප්‍රතිලාභ කොටස් වෙළඳපොලේ ආයෝජනය නොකරන ලදි. විකිණීමෙන් ලද මුළු මුදලම රවී ඔහුගේම ව්‍යාපාරයට යෙදුවේය.

ඉහත සිද්ධිය තුළ ඇති ගැටලු ආශ්‍රිතව පාර්ශවයන්ගේ අයිතිවාසිකම්, යුතුකම් සහ වගකීම් සාකච්ඡා කරන්න. භාර ආඥා පනතේ අදාළ ප්‍රතිපාදන උපුටා දක්වමින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

(50X2 =ලකුණු 100)

**************